GMOA
ESTABLISHED IN 1926
TU No. 291

Tel : 2580886 / 0714 999555
Fax : 2503586 / 4518668
Web : www.gmoa.lk
Email : gmoasrilanka@sltnet.lk

THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No. 275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

22.08.2011

# පුවත්පත් නිවේදනය

## කොළඹ ජාතික රෝහලේ අධ්‍යක්ෂක තනතුරෙහි වර්තමාන තත්වය.

කොළඹ ජාතික රෝහලේ අධ්‍යක්ෂක තනතුරෙහි ඇතිවූ පුරප්පාඩුව පිරවීම සඳහා අයදුම්පත් කැඳවීමෙන් පසුව දැඩි ව්‍යාකූල තත්වයක් ඇතිවිණ. ඒ හේතුවෙන් රෝගී සේවාවට ඉතා වැදගත්වන මෙම තනතුරෙහි වූ පුරප්පාඩුව නිසිපරිදි පිරවීම ප්‍රමාදවිය.

කෙසේ නමුත් රාජ්‍යසේවා කොමිෂන් සභාව මෙම තත්වය තේරුම්ගෙන, ඉතාම කාර්යක්ෂමව සහ අපක්ෂපාතිව කටයුතු කිරීම නිසා මේ වනවිට මෙම පුරප්පාඩුව නිසිපරිදි පිරවීමට අවකාශ සැලසී ඇත.

මේ සම්බන්ධව රජයේ වෛද්‍ය නිලධාරී සංගමයේ ප්‍රසාදය රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පළකරණ අතර කොමිෂන් සභාවේ නියෝගය කඩිනමින් ක්‍රියාවේ යෙදවීමට සෞඛ්‍ය ලේකම්වරයා ක්‍රියාකළයුතු බවද අවධාරණය කරමු.

එමෙන්ම වෛද්‍ය පරිපාලනයේ අනෙකුත් තනතුරු පිරවීමටද සෞඛ්‍ය අමාත්‍යංශය අනලස්ව කටයුතු කරනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

ස්තුතියි.

මෙයට විශ්වාසි,

වෛද්‍ය චන්ද්‍රික එපිටකඩුව,
ලේකම්.

වැඩි විස්තර - වෛද්‍ය ශිහාන් අසීස් 0777772872